ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර

පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**විස්තාරිත පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම 2021/2022**

මෙම විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන පහත සඳහන් විස්තාරිත පාඨමාලා (බාහිර) සඳහා නවක සිසුන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව (බාහිර)</u>**

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | : | මාස - 12 (වසර 01) |
| SLQF ස්තරය | : | 03 වන ස්ථරය (Level 03) |
| ඉගැන්වීම් මාධ්‍යය | : | සිංහල |
| අවම සුදුසුකම් | : | 1. ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් වීම<br>**හෝ**<br>2. ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත් වීම<br>**හෝ**<br>3. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.<br>*අ.පො.ස. (උසස් පෙළ) / ප්‍රාචීන ප්‍රාරම්භ විභාග පදනම් කර ගනිමින් ඉල්ලුම් කරන අයදුම්කරුවන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) බුද්ධ ධර්මය විෂය ඇතුළුව සම්මාන තුනක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම හෝ පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අනිවාර්ය වේ. |
| පාඨමාලා ගාස්තුව | : | අයදුම්පත් ගාස්තුව රු. 1,000.00<br>පාඨමාලා ගාස්තුව රු. 17,000.00 |

---

**<u>ජ්‍යොතිෂය උසස් සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)</u>**

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | : | මාස 06 කි. |
| SLQF ස්තරය | : | 02 වන ස්ථරය (Level 02) |
| ඉගැන්වීම් මාධ්‍යය | : | සිංහල |
| අවම සුදුසුකම් | : | 1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය (සම්මාන තුනක් සහිතව විෂයන් හයක් සහිතව) / මූලික පිරිවෙන් අවසන් විභාගය සමත් වීම.<br>**හෝ**<br>2. ධර්මාචාර්ය විභාගය සමත්වීම.<br>**හෝ**<br>3. පිළිගත් අධ්‍යාපන ආයතනයකින් ජ්‍යොතිෂය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් (SLQF-01) හදාරා සමත් වීම.<br>**හෝ**<br>4. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම. |
| පාඨමාලා ගාස්තුව | : | අයදුම්පත් ගාස්තුව - රු. 500.00<br>පාඨමාලා ගාස්තුව - රු. 18,000.00 |

**දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)**

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | : | මාස 06 කි. |
| SLQF ස්තරය | : | 01 වන ස්ථරය (Level 01) |
| ඉගැන්වීම් මාධ්‍යය | : | සිංහල |
| අවම සුදුසුකම් | : | 1. නවය ශ්‍රේණිය සමත් වීම<br>**හෝ**<br>2. ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කර තිබීම හා යම් විශේෂඥතා ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර දෙකකට සමාන කාලයකට අදාළ සහතික කරන ලද සේවා අත්දැකීම් තිබීම හා අයදුම්කරුගේ වයස අවුරුදු 16ට හෝ ඊට වැඩි වීම<br>**හෝ**<br>3. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම. |
| පාඨමාලා ගාස්තුව | : | අයදුම්පත් ගාස්තුව - රු. 500.00<br>පාඨමාලා ගාස්තුව - රු. 14,500.00 |

*** මෙහිදී අ.පො.ස. (සාමාන්‍ය) පෙළ විභාගය ඉලක්ක කර ගනිමින් ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබයි.**

- මෙම පාඨමාලාවන් සඳහා ඉහත දක්වා ඇති අදාළ සුදුසුකම් සපුරන ගිහි/ පැවිදි/ ස්ත්‍රී/ පුරුෂ ඕනෑම අයෙකුට ඉල්ලුම් කළ හැකිය.

**අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීම**

- අයදුම්පත් හා විස්තර පත්‍රිකා විශ්වවිද්‍යාල නිල වෙබ් අඩවියෙන් (www.busl.ac.lk) බාගත (download) හැකිය.

**අයදුම්පත් භාර දීම**

- අයදුම්පත් යොමු කිරීමේ දී අදාළ පාඨමාලාවට නියමිත අයදුම්පත් ගාස්තුව ගෙවා ඊට අදාළ අයදුම්පත භාවිතා කර අයදුම් කළ යුතුය.
- දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අංක 008-1001-7001-4461 දරන ගිණුමට අයදුම්පත් ගාස්තුව බැර කිරීමෙන් ලබාගන්නා ලදුපත හා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලියකියවිලි සමඟ 2022.05.31 දින හෝ එදිනට පෙර **"සහකාර ලේඛකාධිකාරි, පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර"** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"..................................පාඨමාලාව (බාහිර) සඳහා අයදුම් කිරීම 2021/2022"** ලෙස සඳහන් කළ යුතුය.

**(මහජන බැංකුවේ ගිණුම් අංකයට මුදල් බැර කරන විට ලදුපතෙහි හේතුව යන තීරයේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කිරීම අනිවාර්ය වේ)**

1. උප්පැන්න සහතිකයේ සහතික කළ ඡායා පිටපතක්
2. පැවිදි අයදුම්කරුවන් සඳහා සාමණේර/උපසම්පදා සහතිකයේ සහතික කළ ඡායා පිටපතක්
3. ජාතික හැඳුනුම්පතේ සහතික කළ ඡායා පිටපතක්
4. අධ්‍යාපන සහතිකවල සහතික කළ ඡායා පිටපත්
5. අයදුම්පත් ගාස්තු ගෙවූ ලදුපතෙහි මුල් පිටපත
6. මුද්දර ඇල වූ තම නම ලිපිනය ලියන ලද ලිපි කවර දෙකක්

වැඩි විස්තර - පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය (025-2057978)
විශ්වවිද්‍යාල වෙබ් අඩවිය (www.busl.ac.lk)

ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර.